කම්කරු දෙපාර්තමේන්තුව | DEPARTMENT OF LABOUR

පාලන ශාඛාව | Administration Branch

මාධ්‍ය නිවේදනය | Press Release

දිට්වා සුලි කුණාටුව හේතුවෙන් ඇතිවූ හදිසි ආපදා තත්වය මත ගම්පොල කම්කරු කාර්යාලය පවත්වාගෙන යාමට නොහැකි ලෙස අවධානම් තත්වයක පවතී. එමනිසා, ගම්පොළ පී.බී.පානබොක්ක මාවතේ 6/2/1 ලිපිනයෙහි පිහිටි කම්කරු දෙපාර්තමේන්තුවට අයත් ගම්පොළ කම්කරු කාර්යාලය 2026.01.09 දින සිට තාවකාලිකව වසා දැමීමට කටයුතු කරන අතර, ගම්පොළ කම්කරු කාර්යාලයෙන් ලබාගත් මහජන සේවාවන් ලබාගැනීම සඳහා මධ්‍යම කලාපය තුළ පිහිටි අනෙකුත් කම්කරු කාර්යාල වෙත යොමු වන ලෙස සේවාලාභීන් වෙත කාරුණිකව දැනුම් දෙමි.

සිදුවන අපහසුතාවය පිළිබඳ කණගාටුව ප්‍රකාශ කරන අතර ගම්පොළ කම්කරු කාර්යාලය ගම්පොළ නගරාසන්නයේ ස්ථානයක ස්ථාපිත කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගනිමින් පවතින බවද වැඩිදුරටත් කාරුණිකව දැනුම් දෙමි.

කම්කරු කොමසාරිස් ජනරාල්

කම්කරු දෙපාර්තමේන්තුව

Due to the emergency situation caused by Cyclone Ditwa, the Gampola Labour Office is in a precarious situation and cannot be maintained. Therefore, the Gampola Labour Office of the Department of Labour located at 6271, P.B. Pana Bokka Mawatha, Gampola will be temporarily closed from 09.01.2026, and I kindly inform the clients to refer to other Labour Offices located in the Central Region to obtain public services obtained from the Gampola Labour Office.

I express my regret for the inconvenience caused and kindly inform you that urgent measures have been taken to establish the said labor office in a location on the outskirts of Gampola.

Commissioner General of Labour

Department of Labour